## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2014

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්, විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර තැන්පත් ඇපයට තබා ලබාගෙන තිබූ ණය පහසුකම් වෙනුවෙන් ගෙවන ලද රු. 680,877 ක පොළිය, ස්ථාවර තැන්පතු වලින් ලද පොලියට හිලව් කර තිබීම හේතුවෙන් රු.680,877 ක පොලී වියදම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව මූල්‍ය පිරිවැය වෙනමම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිවිසුම් මාර්ගය සැකසීමේ කොන්ත්‍රාත්තුව සඳහා ලබාදී ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.518,740 ක් ජංගම වත්කම් ලෙස දක්වනු වෙනුවට ප්‍රාග්ධන වියදමක් සේ සලකා ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) වැඩ නිමකර සිසු අයිතියට පවරා තිබුණු නේවාසිකාගාර 02 ක වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම නේවාසිකාගාර සඳහා මිලදී ගත් වටිනාකම නිශ්චිතව හඳුනාගත හැකි වූ රු.8,532,942 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ඇ) කෘෂිකර්ම පීඨයේ කිරි හා මස් සැකසුම් මධ්‍යස්ථානයට අදාලව ගෙවන ලද රු.875,407 ක්වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකරගෙන තිබුණු නමුත්, එය කෙරීගෙන යන වැඩ යටතේ දක්වනවා වෙනුවට තවදුරටත් අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(ඈ) ඉදිරි වර්ෂය සඳහා ගෙවන ලද රු. 483,068 ක ගෙවල් කුලී සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේදී ජාතික විද්‍යා පදනමේ ප්‍රදානයක් වශයෙන් ලැබී තිබූ අරමුදලින් මිලදීගත් වත්කම් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට ප්‍රදාන ගිණුමින් අඩුකර දක්වා තිබුණි. මේ අනුව මිලදීගෙන තිබූ වත්කම් වටිනාකම වූ රු.1,750,000 ක් වත්කම් ලෙස නිරූපනය නොවූ අතර රාජ්‍ය ප්‍රදානයන්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. මෙම තත්ත්වය මත වත්කම් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදනයද සිදුකර නොතිබුණි.

(ඊ) උප කුලපති නිල නිවස වටා තාප්පයක් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කාරු වෙත ගෙවා තිබුණු රු.7,326,743 ක මුදලක් වැඩ නිමකර ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රාග්ධනිත කර තිබිණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මුදල් කරන ලද රු.43,000,000ක ස්ථාවර තැන්පතු වලට අදාලව ලැබී තිබුණු පොලිය රු. 321,584ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වත්කම් ක්ෂය ලෙස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණු රු. 217,859,998 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. 2008 වර්ෂයේ මිලදී ගත් රු.1,279,860 ක් වටිනා මෝටර් රථ වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා රු.194,209 ක් ක්ෂය කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

ii. විශ්වවිද්‍යාලයේ ක්ෂය ප්‍රතිපත්තියට අනුව වත්කම් මිලදීගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කළ යුතු නමුත් 2009 වසර තුල මිලදී ගත් වත්කම් 17 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රමාණය වෙනුවෙන් ක්ෂය ගණනය නොකිරීම නිසා වාර්ෂික ක්ෂය වියදම රු.9,411,811 කින් අඩුවෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කරන ලද රු. 1,494,736ක් වූ ප්‍රාග්ධන වියදම් අදාල වත්කම් යටතේ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර වත්කම් පුනරුත්ථාපන වියදම් යටතේ දක්වා තිබුණි.

(ඒ) විශ්වවිද්‍යාලයේ පැරණි භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම රු. 1,244,887 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඉවත් කර ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

### 2.2.3 නොසැසඳුණු පාලන ගිණුම්

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුව වැඩ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 38,372,097ක් වුවද ඊට අදාල විස්තරාත්මක උප ලේඛන අනුව එම ශේෂය රු. 38,723,063 ක් වීමෙන් රු. 350,966 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණු රු. 2,657,133 ක ඉන්ධන වියදම් හා 2013 වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණු රු. 7,478,277 ක ඉන්ධන වියදම් සහ රු.4,436,025 ක වාහන නඩත්තු වියදම් පරික්ෂා කිරීම සඳහා වාහන ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 50 කදී ධාවනය කර තිබූ කිලෝමීටර් 5,904 ක් පිළිබඳ ගමනේ යෙදුන වගකිව යුතු නිලධාරීන් ධාවන සටහන් අත්සන් කර නොතිබීම හේතුවෙන් එම ගමන් සඳහා දරන ලද රු. 87,397 ක ඉන්ධන වියදම් වලට අදාල ගමන් තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

## 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර විදේශ ගමන් වලදී යානපත්‍ර මිලදී ගැනීමේ සහ ගුවන් ගමන් සංවිධානය කිරීමේ කටයුතු රාජ්‍ය බැංකු යටතේ පාලිත

සමාගම් වන බී.ඕ.සී ට්‍රැවල්ස් හා පීපල්ස් ට්‍රැවල්ස් යන සමාගම් මඟින් ඉටුකර ගතයුතු බව දක්වා තිබුණද, බැංගලෝරයේ විදේශ සම්මන්ත්‍රණයකට සහභාගි වූ නිලධාරීන් දෙදෙනෙකු සඳහා රු.63,000 ක් වන යාන පත්‍ර චක්‍රලේඛයෙහි සඳහන් නොවූ ආයතනයක් මඟින් මිලදී ගෙන තිබුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙණු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 ජනවාරි 01 දිනැති අංක BD/CBP/4/1/14/2014 දරන අයවැය චක්‍රලේඛ අංක 1/14 හි 2.1.5 ඡේදය ප්‍රකාරව ආයතනයේ සේවකයන් සම්බන්ධයෙන් කෙරෙන සියළු ගෙවීම් භාණ්ඩාගාර අනුමැතිය ඇතිව නිකුත් කෙරෙන චක්‍රලේඛයන්ට අනුකූල විය යුතු අතර එවැනි චක්‍රලේඛයන්ගෙන් ආවරණය නොවන ගෙවීම් කිරීමට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව පමණක් එවැනි ගෙවීම් කළ යුතුය. එහෙත් ඊට පටහැනිව වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා ආධුනික කථිකාචාර්යවරුන් සඳහා පිළිවෙලින් රු.100,000, රු.80,000 ක් සහ රු. 50,000 ක් රඳවා ගැනීමේ දීමනා ලෙස මාසිකව ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල එසේ ගෙවා තිබූ දීමනා වල එකතුව රු.4,782,500 ක් විය.

(ආ) 2014 ජුලි 17 දිනැති අංක 07 /2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව 2011/2012 අධ්‍යයන වර්ෂය පාදක කොටගෙන සියයට 10 ක අතිරේක ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කළ යුතු බවද, ඒ සඳහා පවතින ශිෂ්‍ය ඉල්ලුම අඩු වන්නේ නම් ඉල්ලුම වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය නව්‍යකරණ වැඩ පිළිවෙලක් සැකසීමට ක්‍රියාමාර්ග ගත යුතු බවද ඒ සඳහා දිරි ගැන්වීමක් ලෙස අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මූලික වැටුපෙන් සියයට 20 ක අතිරේක දීමනාවක් ගෙවිය හැකි බවද, පෙන්වා දී තිබුණි.එහෙත් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය හැර අනෙකුත් පීඨවල අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම අපේක්ෂිත ආකාරයට සිදුවී නොතිබුණු අතර 2011/2012 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 2013/2014 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍යයන් බඳවා ගැනීම අපේක්ෂිත ඉලක්කයට ලඟාවී නොතිබියදී විශ්වවිද්‍යාලයේ සමස්ථ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා මෙම දීමනාව ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් රු. 4,645,369 ක අතිරික්තයක් ඇති වී තිබුණු අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 18,154,195 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 22,799,564 ක වර්ධනයක් විය. බාහිර පාඨමාලාවලින් ලද ආදායම් රු. 19,816,282 කින් වැඩිවීම වර්ෂයේ අතිරික්තය සඳහා හේතු වි තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 ඒක ශිෂ්‍ය පිරිවැය**

සමාලෝචිත වර්ෂයේදි ඒක ශිෂ්‍ය පිරිවැය රු.112,803ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.89,734 ක් විය. එක් එක් පීඨ වශයෙන් සැලකීමේදී ඉහලම ඒක ශිෂ්‍ය පිරිවැය වූ රු. 283,170 ක් කෘෂිකර්ම පීඨයෙන් වාර්තා වූ අතර සමාජ විද්‍යා පීඨයේ එය රු.53,162ක් විය. අනෙකුත් පීඨයන්ට සාපේක්ෂව කෘෂිකර්ම පීඨය සඳහා අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීම ඒක ශිෂ්‍ය පිරිවැය ඉහල යෑමට හේතුවී තිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටා ඇති පොලිස් නිල නිවාස 40 හා එම ඉඩම විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට 2006 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලබාදී ඇති රු.මිලියන 18ක මුදල ආයෝජනය කර ඊට අදාලව ලද පොළිය සමඟ එකතුව රු.34,268,598 ක මූල්‍ය ප්‍රතිපාදන තිබියදී එම මුදල් ගෙවා පොලිස් නිවාස පවරා ගැනීමට කටයුතු නොකර ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා පෞද්ගලික නිවාස 61 ක් කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 24,004,800 ක මුදලක් නිවාස කුලී වශයෙන් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.

**4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම පීඨය පුළුල් කිරීමේ කටයුතු සඳහා අක්කර 15 ක පමණ ඉඩමක් අත්පත් කරගැනීම වෙනුවෙන් 2011 වර්ෂයේදී මධ්‍යම නුවරගම් පළාතේ ප්‍රාදේශීය ලේකම් වෙත රු. 7,200,000 ක මුදලක් තැන්පත් කර ඇතත්, අදාල පවරා ගැනීම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල නිමකළ යුතු කෘෂිකර්ම පීඨයේ කාන්තා නේවාසිකාගාරය ඉදි කිරීම හා ව්‍යවහාර විද්‍යා පීඨයේ විද්‍යාගාරය ඉදි කිරීම් ව්‍යාපෘති විගණිත දිනය වූ 2015 මාර්තු 31 දින වන විට ඉදි කිරීම් මාස 03 සිට මාස 08 දක්වා කාලයක් ප්‍රමාද වී තිබූ බව නිරීක්ෂණය විය.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

(අ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 118ක හා අනධ්‍යාන කාර්ය මණ්ඩලයේ තනතුරු 81ක පුරප්පාඩු පැවතුණි.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු අතරින් වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයේ මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා ආධුනික කථිකාචාර්ය පුරප්පාඩු 48 ක් පැවති අතර එම පුරප්පාඩු වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරුන් 36 දෙනෙකු සේවයේ යොදවාගෙන එම කාර්යයන් ඉටුකරවාගෙන තිබුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා**

(අ) විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.2,583,585 ක තිරරෙදි සපයා සවිකිරීමේදී පහත සඳහන් කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා නිරීක්ෂණය විය.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සෘජු කොන්ත්‍රාත් පිරිනැමියහැකි අවස්ථාවන්ගෙන් පරිබාහිරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සහභාගි වීමට අවස්ථාව නොදී ලක් සළු සල ආයතනයෙන් සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට මෙම මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මිලදී ගත හැකි උපරිම මූල්‍ය සීමාව රු.250,000 ක් වුවද, එම සීමාව ඉක්මවා රු. 2,583,585 ක තිරරෙදි මිලදී ගැනීමට අදාල කොන්ත්‍රාත්තුව ලංසු පරිපාටීන්ගෙන් බැහැරව සෘජු කොන්ත්‍රාත් යටතේ ප්‍රදානය කර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමින් ගෙවිය හැකි සියයට 20 ක අත්තිකාරම් මුදල ඉක්මවා සියයට 50ක් අත්තිකාරම් ගෙවා තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය ප්‍රකාරව සැපයුම හෝ සේවාව සිදුකර නිශ්චිත කාලයක් සඳහා රඳවාගැනීමේ මුදල් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් රඳවාගත යුතු වුවද එසේ සිදු නොකර මුළු මුදලම නිදහස් කර තිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) ප්‍රකාරව කොන්ත්‍රාත්තුවක් පිරිනැමීම සඳහා සියයට 5ක කාර්යසාධන සුරක්ෂණයන් තබා නොගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

## 4.6 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර නේවාසිකාගාර 06 ක් කෘෂිකර්ම පීය කාන්තා නේවාසිකාගාර වශයෙන් කුලියට ගැනීම නිසා එම පීඨයේ සිසුන් 250 ක් සඳහා නේවාසික පහසුකම් සැපයීමට කාන්තා නේවාසිකාගාරයක් ඉදිකිරීමට රු.110,195,344 කට පිරිනමන ලද කොන්ත්‍රාත්තුව 2014 ජූලි 31 දින නිම කිරීමට නියමිතව තිබුණි. එහෙත් 2015 ජූලි 31 දින වනවිටත් එහි කටයුතු නිමකර නොතිබීම හේතුවෙන් ඉදිකිරීම් නිම කළ යුතු දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා තවදුරටත් රු.1,072,500 ක් නේවාසිකාගාර කුලී වශයෙන් ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුල සිදුකර නොගැනීම හා ඉදිකිරීම් අධීක්ෂණයේ දුර්වලතා හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.1,072,500 ක අලාභයක් දැරීමට සිදු වූ අතර කොන්ත්‍රාත්කරුගෙන් අය නොවූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.11,872,672 ක් විය.

(ආ) 2013 මැයි 08 දිනැති අංක HE/D/2013/32 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව Turn Key Basis ක්‍රමයට ඉදිකිරීම සඳහා ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාගාරය හා දේශන ශාලා ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත දින සිට 2015 අගෝස්තු 30 දිනට මාස 08ක ප්‍රමාදයක් සිදුවී තිබුණි.කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් නිසා මෙම ව්‍යාපෘතිය ප්‍රමාදවී තිබූ නමුත් විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල මිල විචලනය ලෙස රු.96,914ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ අතර අය නොවූ වැඩ ආරම්භ කිරීම් අත්තිකාරම් රු.6,437,562 ක් විය.

(ඇ) විශ්වවිද්‍යාලයේ කාර්යාලීය අවශ්‍යතා සහ අධ්‍යයන කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා භාවිතා කිරීම සඳහා ප්‍රමාණවත් වාහන සංචිතයක් පැවතියදී එම කාර්යයන් සඳහා කුලී පදනම මත වාහන 08ක් සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂය තුල රු.6,265,784 ක කුලී රථ ගාස්තු ගෙවා තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ උද්‍යාන නඩත්තු සේවා සැපයීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සකස්කළ ප්‍රසම්පාදන ලියකියවිලිවල තරඟකාරිත්වය අධෛර්මත් කරවන කොන්දේසි ඇතුලත් කිරීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පැවති සියළු ලංසු වලදී අපේක්ෂා කරන ලද සුදුසුකම්, කිසිදු ලංසුකරුවෙකු සපුරා නොතිබියදී එකම ආයතනයකට ලංසුව පිරිනමා තිබූ අතර එම ආයතනය 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලංසුවේ වටිනාකම වාර්ෂිකව රු. 4,302,365 සිට රු. 24,068,615 දක්වා ඉහළ දමමින් ලංසුව ලබාගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාල උද්‍යාන නඩත්තු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවී තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල එම වියදම රු. මිලියන 24 ක්ද ඉක්මවා තිබුණි.

**4.7 හඳුනා ගන්නා ලද පාඩු**

සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබූ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව වටිනාකම හඳුනාගත නොහැකි පොත් 3,807 ක ඌනතාවයක් වූ අතර පොත් 4,152 ක් භාවිතයට නොගෙන ගොඩගසා තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර උපකුලපති වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වාහන පාලනය